# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/26 - 2019 දෙසැම්බර් මස 04 වැනි බදාදා - 2019.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත් කිරීම්/ඉවත් කිරීම්

දකුණු පළාතේ පළාත් ආණ්ඩුකාරවර ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ වන මම දකුණු පළාත් සභාව යටතේ පවතින පහත අධිකාරි වල පහත දක්වා ඇති පරිදි ඉවත් කිරීම් සිදු කරනු ලබන බව නිවේදනය කරමි.

#### පළමු නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) සහ 154 (ඊ) (2) ව්‍යවස්ථා මගින් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව සහ 1996 අංක 2 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී ප්‍රඥප්තියේ 3 (7) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් අය දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ධූරයන්ගෙන් 2019.12.02 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් කරනු ලැබේ.

(අ) කේ. එච්. කපිල සේනාරත්න මහතා
(ආ) පියසේන ගුරුගේ මහතා
(ඇ) ඩබ්. ටී. පුණ්‍යසිරි මහතා
(ඈ) ඒ. එච්. හර්මන් සරත් ද සිල්වා මහතා

#### දෙවන නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) සහ 154 (ඊ) 2 ව්‍යවස්ථා මගින් මා වෙත පැවරෙන බලතල ප්‍රකාරව සහ 1992 අංක 4 දරන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් අය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ධූරයෙන් 2019.12.02 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් කරනු ලැබේ.

(අ) එච්. පී. කේ. නිශාන්ත කුමාර මහතා

ආචාර්ය ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2019 දෙසැම්බර් මස 03 වැනි දින,
ගාල්ල, පහල ඩික්සන් පාරේ,
දකුණු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

12 - 590

1A - PG 4782 — 32 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*